Page 14 April 2013.qxd 28/05/2013 15:13 Page 1



# ඔන්න අපේ ශ්‍රී ලංකාව! ඔන්න අපේ කටුනායක!



පිටරටවල් වල පදිංචිවෙලා ඉන්න ලාංකිකයෝ කොයි තැනක එකතුවුනත්, මොන තරම් දේවල් කතාකළත්, ඒ හැම කතාවකම වැඩි කොටසක් තියෙන්නේ ලංකාව ගැනම තමයි. ලංකාවෙ හොඳ නරක වගේම, ලැබුණු අත් දැකීම් ගැන කතාකරද්දි පැහැදිලිවම පේනවා කොයි තරම් කාලයක් පිටරටවල හිටියත් හිත තියෙන්නෙ ලංකා වෙයි කියලා. අගෝස්තු ඉස් කෝල නිවාඩුවට ලංකාවට යන්න ටිකට් ගණන් හොයලා, බුක්කරන්න ලෑස්තිවෙන්නෙ මාස හත අටකටත් කලින්.

ඒ වගේම දැනට පදිංචි රටේ ගුවන් තොටුපලෙන් ගුවන්යානයට නැගිලා අහස් ගත වුණු වෙලේ ඉඳලම කල්පනාකරන්නෙ කටුනායකින් බහින හැටි. ලංකාවෙ ඉන්න අම්මා, තාත්තා, සහෝදර සහෝදරියෙ තමන් එක්ක යන්න ගුවන් තොටුපලට ඇවිත් බලා ඉන්න හැටි. දවල් වෙලාවක නම්, ලංකාවෙ දේශ සීමාවට ගුවන් යානය කිට්ටු වෙච්ච ගමන් ඉඳලා යානයෙ කවුළුවෙන් බලන් ඉන්නේ, අනේ තව ටිකයි, තව ටිකයි බහින්න කියලා. ලංකා මුහුදු තීරය උඩින් යද්දි, පොල් ගස් පේන කොට දන්නවා දැන් ඉතින් කිට්ටුවටම ඇවිත් බව. හිතේ නොසන්සුන්කම වැඩි වෙනවා. මෙලෝ සිහියක් නෑ දැන් බහින කල්. ප්ලේන් එක නවත්වපු ගමන් දඩි බිඩි ගාලා නැගිටලා ගමන්මලු අතට අරන් හිට ගන්නවා. ගුවන්යානයේ දොර අරින කල් ඉවසිල්ලක් නෑ එලියට පනින්න. පාස් පෝට් කවුන්ටරේ හරි, බෑග් එන තැන හරි පරක්කු වෙනකොට තවත් හිතට අමාරුයි. ගුවන් යානය ඇතුලෙ පැය දහයක් පහලොවක් ආවට වැඩිය හදිස්සියි ගුවන් තොටුපලෙන් එලියට යන්න.

මේ හැම හදිස්සියක්ම ඇයි? මේ ආවෙ අපේ රටට, අපේ පුරුදු තැනට, කියන හැඟීම නිසා. කටුනායක ගුවන්තොටුපළේ ධාවන පථයෙ ප්ලේන් එකේ රෝද බිම වදින කොට දැනෙන්නෙ මොන වගේ හැඟීමක්ද ? ඒ හැඟීම තමන් පදිංචි රටට ආපහු ආවම කවදාවත් දැනිලා තියනවද? නෑ. කවදාවත් දැනෙන්නෙ නෑ.

දැන් මේ කියපු තරම් ආසාවෙන් අපි හැමෝම යන අපේ රටෙන් ආපහු පිටත් වෙනකොට ඒ යන කොට තිබ්ච්ච සතුට එහෙමම තියෙනවද? දුක වාගෙම අපට ලැබෙන සැලකීම ගැන මොනතරම් කළකිරෙනවද? මීට කලින් මම ලිව්වා ඔබට මතක ඇති, මම ගිය අවුරුද්දෙ ලංකාවට ගිය වෙලේ තරුපහේ හෝටලයකදී හෝටලයේ පිළිගැනීමේ නිලධාරි කාන්තාව මාත් එක්ක ගිය සුද්දට මල්මාලයක් දාලා, අනික් මල්මාලෙ මට නොදා ආපහු අරගෙන ගියා කියලා. එහෙමයි අපේ රටේ ලාංකික අපට ලැබෙන සැලකීම සහ අවතක්සේරුව.

මේ සැරේ මම දැක්කෙ ශ්‍රීලංකාවෙ අපේ මව් බස වන සිංහළට තියන පහත් සැලකිල්ල. කටුනායක ගුවන් තොටුපළේ ශබ්ද විකාශනයෙන් මඟීන්ට නිවේදන නිකුත් කරන්නේ ඉංග්‍රීසියෙන් විතරයි. කලාතුරකින්, ඒ කියන්නේ එකම එක සැරයක්, සිංහළෙන් නිවේදනයක් කියෙව්වා මට ඇහුණා. ඒකත් කෝච්චියෙන් යනව වගේ සීඝ්‍රගාමීව තත්පරේට දෙකට කියවලා දැම්මා.

මම පිටත්වෙන ශාලාවට ඇවිල්ලා වාඩිවෙලා හිටියා, මගේ ගුවන් යානයට නගින්න කියලා නිවේදනය ඇහෙන කල්. අරාබි රටක ගුවන් සේවයක් නිසා මැද පෙරදිග රටවලට යන ලංකාවෙ උදවිය සෑහෙන්න හිටියා. මේ අතරෙ නිවේදනයක් දුන්නා ඉංග්‍රීසියෙන් විතරක්. එතන හිටි හුඟ දෙනෙකුට තේරුණේ නෑ, ඒ මොකක්ද කිව්වෙ කියලා. සමහරු උඩබිම බලන්න පටන්ගත්තා. අනිත් අයගෙ මූණු බලනවා, මොනව හරි දෙයක් තේරුම්ගන්න. ඒ නිවේදනයෙන් කියලා තියෙන්නේ ගුවන් යානය මඳක් ප්‍රමාද වෙනවයි කියලයි. තව ටිකකින් ආයිත් ඉංග්‍රීසියෙන් නිවේදනයක් කළා, සීට් අංක විස්සේ සිට තිස් පහ දක්වා හිමි මඟීන් දොරටුව ළඟට එන්න කියලා. කියපු ගමන් ටික දෙනෙක් නැගිටලා දොර ළඟට යන්න පටන් ගත්තා. ඒ එක්කම ශාලාවෙ හිටපු මඟීන් වැඩි දෙනෙක් හෝස් ගාලා නැගිටලා බඩුත් ඇදගෙන අර ගේට්ටුව ළඟට දුවන්න පටන්ගත්තා.

දැන් ඒ ගේට්ටුව ළඟ ඉන්න සේවිකාවට වැඩ වැඩිවුණා. එතන හරි අවුලක්. නගින්න හදන අය නවත්තනවා. ඕගොල්ලන්ට නොවයි එන්න කිව්වෙ කියනවා. ඔය අයට පස්සෙ කතාකරන්නම් කියලා ආපහු යවනවා. සමහරු ගුවන් සේවිකාවන්ට දොස් කියනවා. අපි එහෙනම් හෙටද යන්නෙ කියලා අහනවා. මේක හරි වැඩක් නේ කියනවා. ඔය වගේ මහා කලබැගෑනියක්. ඒ සේරම වුනේ අර නිවේදනය ඒ මිනිස් සුන්ට හරිහැටි තේරෙන සිංහළ බාසවෙනුත් නොකරපු හින්දයි.

මම ගිහිල්ලා අර ඉංග්‍රීසියෙන් නිවේදනය දුන්නු කෙනාගෙන් ඇහුවා: " ඇයි මහත්තෙයෝ මේ ශබ්ද විකාශන යන්ත්‍ර සිංහළ භාෂාවට වැඩකරන්නේ නැද්ද? මහත්තයලා නිවේදන දෙන්නෙ ඉංග්‍රීසියෙන් විතරයි. ඒ මොකද? මේක සිංහළ රටක් නෙවෙයිද? මේ රට තාම එංගලන්තෙට අයිතිය කියලා ඔහේලා හිතනවද? එහෙම නැත්නම් මහත්තේලාගේ මව්බාසාව සිංහළ නෙවෙයිද? කියලා. එතකොට ඒ එක්කෙනා මෙහෙම කිව්වා මේවා තීරණය කරන්නෙ අපි නෙවෙයි....උඩින්...අනික තමයි, විදේශ රටවල ගුවන් සේවා වලින් අපිට ලියලා දීලා තියෙන්නේ ඉංග්‍රීසියෙන් විතරයි.

මම ඇහුවා, " හරි, ඉංග්‍රීසියෙන් ලියලා දුන්නට ඒ අය කිව්වෙ නෑ නේ මේක ඉංග්‍රීසියෙන් විතරක් කියවන්න කියලා. සිංහලෙන් මේ පණිවුඩය දෙන්න එපයි කිව්වෙ නෑ නේ.? " මේ මනුස්සයා ගොලුව වගේ මගේ මූණ දිහා බලං ඉන්නවා. මම කිව්වා " මහත්තෙයෝ ඉස්සරවෙලා නිවේදනයක් දෙන්න ඕන සිංහලෙන්. ඊළඟට දෙමළෙන්. අන්තිමට ඉංග්‍රීසියෙන්. ඉන්දියාවෙ, චීනේ, ජපානෙ, ප්‍රංශයේ, ඉතාලියේ, ස්පාඤ්ඤයේ, පෘතුගාලෙ, අරාබියේ ආදී ලෝකයේ ඔය ඕනම රටක ගුවන් තොටුපළවල්වල ඉස්සෙල්ලාම දෙන්නේ ඒ රටේ මව් භාෂාවෙන්. ඉංග්‍රීසියෙන් දෙන්නෙ ඊට පස්සෙ. අරාබි ගුවන් සේවයෙන් නිවේදනය ලියලා දුන්න පලියට අපේ රටේ මව්බාසාව අතඇරලා ඉංග්‍රීසියෙන් විතරක් නිවේදන දාන්නෙ නෑ. ඔය මහත්තුරු හොඳට දන්නවා මැදපෙරදිග යන අපේ රටේ බොහොම දෙනා කතාකරන්නේ තමන්ගෙ මව්බාසාව විතරයි. අර ගේට්ටු හොයාගෙන දුවපු වැඩි දෙනා ඒ අය. ඒ මිනිස් සුන්ට ඔහේලගෙ ඉංග්‍රීසි තේරිච්ච නැති නිසා තමයි නන්නත්තාර වෙලා වගේ ඒ සමහරු උඩ බිම බල බල දිව්වේ. මොකක්ද ඔහේලගෙ ඔය වැඩේ තේරුම? අඩු ගණනේ මම මෙහෙම කිව්ව බවවත් සටහන් කරගෙන ඔය නිවේදන ලෑස්තිකරන ඔහේලගේ ලොක්කන්ට කියන්න."

කිසි දෙයක් නොකිය මෑන් ඔලුව වන වන මගේ කතාව අහගෙන හිටියා. එතකොට ආයිත් තව කෙනෙක් ඉංග්‍රීසියෙන් නිවේදනයක් කළා. මට තේරුණා, ඒ දැන් අඬගහන්නේ තවත් අංක පේලියකට බව. මට යාන්තම් මගේ අංකය ඇහුණා. මම බෑග් එක කරේ එල්ල ගෙන අපේ නිවේදක කලු සුද්දා දිහා බලලා පොඩි හිනාවක් දාලා අත වනාගෙන ඉදිරියට ඇදුණා.

මෑන් තවම කටුනායක ඒ හිටපු විදියටම ගල්ගිල්ලා වගේ බලාගෙන ඉන්නවද දන්නෙ නෑ.

ඔන්න අපේ ලංකාව! ඔන්න අපේ කටුනායක!

♦ ජෝර්ජ් කුමාරසිංහ London E17

ලංකාවිත්ති
LANKA VITHTHI
වසර 16ක් පුරා ඔබෙන් වූ අමිල සේවයට අපේ නොවක් පැසසුම් !



පෙරේරා සහ සමාගම
PERERA & CO
Solicitors
301 Romford Road
Forest Gate
London E7 9HA



## රටට ගිය කලක් !

එකෙකුගෙ වැටුප පන්ලක්‍ෂයකට වැඩිය
රුපියල් හය දහකි තවකෙකුගේ පඩිය
පිටටම ඇලි ඇත අසරණ බඩ ගෙඩිය
පාලකයෝ සිටිති තර කරගෙන මඩිය

වැඩි වී දිනෙන් දින ඇති නැති පර තරය
අහසට පොළව මෙන් මේ වන විට දුරය
සියයට දහ අටක් වැනි වූ සුළු තරය
වැජඹෙති ලබා රට සූරාකන වරය

රටටම මහ බරකි කැබිනෙට්ටුව යෝද
සේවය මොවුන්ගේ කවුරුන් උදෙ සාද
දෙස් පාලුවන්ගේ ලැබ ආසිරි වාද
සිදුවෙයි රටේ අති බිහිසුණු අප රාද

දරුවෝ මන්දපෝෂණයෙන් යෙති වැරි
පාලක පෙලැන්තිය අලිඇත්තුය බිරි
පණවා නොයෙක් අයබදු හිංසා කාරි
එළිපිට උරා බොයි ජනතාවගෙ රිරි

නිතියෙ දෙවඟනගෙ ඇඟ සළුපිළි ගලවා
නිරුවත් කොට තිබේ වලපල්ලට එළවා
ජනතාවාදයේ බොරු ලේබල් අලවා
ගත්තෙමු අපිම බලයෙන් අපටම කෙළවා

පළවා රටින් බිහිසුණු යුද නමැති යකා
සිව් වසරක්ම ගෙවුණද තිබු අඳුර මකා
නැත සහනයක් ලැබුණේ දිවි රැකුම තබා
අපි දුක් විඳින්නෙමු අදටත් බඩය නොකා

වැල්පාළම් උඩින් වැනෙමින් හතර අත
නැතිනම් දියේ බැස ඇඳුමින් යුතුව තෙත
ගම්බද ළමෝ යෙති උගෙනුම පිණිස පොත
රත්වෙයි කෝපයෙන් මේවා දකින නෙත

විදුලිය ගෑස් මිළ දවසින් දවස නගී
මිරිකෙති ණය බරින් නැති බැරි පිරිස දුගී
බස්කාරයෝ ලේ බොති උදවියගෙ මගී
පඩිපත එහෙත් නොසැලි හිටි තැනම ලගී

යටකොට මතුව මේ සියළුම අබි යෝග
පාළම් ගුවන් මං මාවත් අදි වේග
ඉදිවෙයි එහෙත් පැතිරෙයි නොඇසුව රෝග
නියඟෙන් දියෙන් වැනසී යයි බව බෝග

ජීවන වියදමේ දැඩු අඬුවට බොටුව
හිරවී සිටින ජනතා දුක නොම දුටුව
නායක රනිල් බල තන්හාවට කොටුව
මහ සටනක් කරයි රැකගන්නට පුටුව!

♦ තලන්ගම ජයසිංහ
Sri Lanka